# ප්‍රවෘත්ති නිවේදනය

## ජාතික පාරිභෝගික මිල දර්ශකය (පදනම 2013 = 100) : 2018 දෙසැම්බර්

## ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

දුරකථනය: 011-2147414 ෆැක්ස්: 011-2877945 ඊමේල්: prices@statistics.gov.lk

ජාතික පාරිභෝගික මිල දර්ශකය නිකුත් කරමින් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්, 2018 දෙසැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 0.4%ක් බව ප්‍රකාශ කලේය. පසුගිය නොවැම්බර් මාසයේ ලක්ෂ්‍යමය උද්ධමනය 1.0%ක් ලෙස වාර්තා විය. 2018 දෙසැම්බර් මාසයේ උද්ධමනය සඳහා ආහාර කාණ්ඩයේ -2.1%ක හා ආහාර නොවන කාණ්ඩයේ 2.5%ක දායකත්වයක් පිළිවෙලින් ලබා දී ඇත. එහෙත් 2017 දෙසැම්බර් මාසයේ 7.3% ක්වූ උද්ධමනයට ආහාර කාණ්ඩයේ දායකත්වය 5.7%ක් හා ආහාර නොවන කාණ්ඩයේ දායකත්වය 1.6%ක් විය.

ජාතික පාරිභෝගික මිල දර්ශකයේ මාසික වෙනස්වීම සංසන්දනය කලවිට, 2018 නොවැම්බර් මාසයේ 127.7ක් වූ දර්ශකාංකය 2018 දෙසැම්බර් මාසයේ 127.1ක් දක්වා පහළ යාමක් වාර්තා විය. පසුගිය මාසය හා සංසන්දනය කලවිට 2018 දෙසැම්බර් මාසයේ දර්ශකාංකය 0.6ක අඩුවීමක් එනම් -0.5ක ප්‍රතිශතකාංක අඩුවීමක් වාර්තා විය. මෙම මාසික වෙනස්වීමට ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.17%කින් අඩුවීම හා ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම 0.27%කින් අඩුවීම දායක වී ඇත.

ආහාර කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා එළවළු, දෙහි, ලොකුළූණු, කෙසෙල්, පොල්, අඹ සහ අන්නාසි යන ආහාර ද්‍රව්‍යවල මිල අඩුවීම බලපා ඇත. එසේ වුවත් සහල්, අමු මිරිස්, අළුත් මාළු, පැපොල්, බිත්තර, අර්තාපල්, කොස් මදුළු හා කොස් ඇට, කුකුල් මස් සහ රතුළූණු යන ආහාර ද්‍රව්‍යවල මිල වැඩිවීමක් වාර්තා වී ඇත.

පසුගිය මාසය හා සංසන්දනය කලවිට, 2018 දෙසැම්බර් මාසයේ ආහාර නොවන කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා 'ප්‍රවාහන', 'සන්නිවේදන' සහ‘මධ්‍යසාර පාන වර්ග, දුම්කොළ හා මත්ද්‍රව්‍ය’ යන කාණ්ඩවල වියදම්වල වටිනාකම අඩුවීම බලපා ඇත. ඉන්ධන මිල ගණන් ( පෙට්‍රල් සහ ඩීසල්) සහ බස් ගාස්තු අඩුවීම 'ප්‍රවාහන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා බලපා ඇත. එසේම දුරකථන ගාස්තු අඩුවීම 'සන්නිවේදන' කාණ්ඩයේ වියදම්වල වටිනාකම අඩුවීම සඳහා බලපා ඇත. එසේ වුවත් ‘රෙදිපිළි හා පාවහන්’ කාණ්ඩයේ වියදම්වල වටිනාකම වැඩිවී ඇත. තවද‘විවිධ භාණ්ඩ හා සේවා’ කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු වැඩිවීමක් හා 'විනෝදාත්මක හා සංස්කෘතික’ කාණ්ඩයේ වියදම්වල වටිනාකම සුළු අඩුවීමක් පසුගිය මාසය හා සන්සන්දනය කළවිට වාර්තා විය. එමෙන්ම පසුගිය මාසය හා සංසන්දනය කලවිට 'නිවාස, ජලය, විදුලිය, ගෑස් හා වෙනත් ඉන්ධන', ‘ගෘහ උපකරණ හා ගෘහ ඒකක නඩත්තු කටයුතු', ‘සෞඛ්‍ය', ‘අධ්‍යාපන’ සහ 'ආපනශාලා සහ හෝටල්' කාණ්ඩයේ කිසිදු අයිතමයක මිලෙහි වෙනසක් වාර්තා නොවිය.

**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම: 2013=100) සහ ලක්ෂ්‍යමය උද්ධමනය**




**ජාතික පාරිභෝගික මිල දර්ශකයේ විචලනය (පදනම : 2013 = 100)**

| වර්ෂය | මාසය | දර්ශකාංකය | දර්ශකාංකයේ මාසික වෙනස්වීම (%) | ලක්ෂ්‍යමය උද්ධමනය (%) |
|---|---|---|---|---|
| **2017** | දෙසැම්බර් | 126.6 | 0.2 | 7.3 |
| **2018** | ජනවාරි | 125.8 | -0.6 | 5.4 |
| | පෙබරවාරි | 123.7 | -1.7 | 3.2 |
| | මාර්තු | 122.8 | -0.7 | 2.8 |
| | අප්‍රේල් | 122.9 | 0.1 | 1.6 |
| | මැයි | 124.3 | 1.1 | 2.1 |
| | ජූනි | 126.5 | 1.8 | 2.5 |
| | ජූලි | 126.6 | 0.1 | 3.4 |
| | අගෝස්තු | 125.4 | -0.9 | 2.5 |
| | සැප්තැම්බර් | 124.4 | -0.8 | 0.9 |
| | ඔක්තෝම්බර් | 124.9 | 0.4 | 0.1 |
| | නොවැම්බර් | 127.7 | 2.2 | 1.0 |
| | දෙසැම්බර් | 127.1 | -0.5 | 0.4 |